# පඬුවස්නුවර හුදු පාලන මධ්‍යස්ථානයක් පමණක් ම ද?

## ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

ඩී.එම්. නදීර හර්ෂජිත්[9]

---

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පඬුවස්නුවර පුරාවිද්‍යා ක්ෂේත්‍රය හඳුනාගත හැක්කේ පැහැදිලි ලෙස ම පැරණි පාලන මධ්‍යස්ථානයක් හා එය මූලික කොටගත් ආගමික ක්ෂේත්‍රයක් වශයෙනි. වංසකතාදී මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යා සාධක මගින් මෙම ස්ථානයෙන් හමුවන ස්මාරක බහුතරයක් ක්‍රි. ව. 12වැනි සියවසෙන් මෙපිටට අයත් වේ යැයි හඳුනාගෙන තිබේ. පළමුවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1153 - 1186 ) පොළොන්නරුවේ පාලකයා වීමට මත්තෙන් දක්ඛිණ දේශයේ පාලකයා වශයෙන් මෙහි පාලන මධ්‍යස්ථානයක් පිහිටුවා ගැනීම හා ඔහු පොළොන්නරුවේ පාලකයා බවට පත් වීමෙන් අනතුරුවත් මෙම ස්ථානය සම්බන්ධයෙන් ඔහුගේ අවධානය යොමු වීමත් දැකිය හැකි ය. පාරාක්‍රමබාහු රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් පොළොන්නරුවේ පාලකයන් ද පඬුවස්නුවර සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලදී. මේ සඳහා හොඳ ම නිදර්ශනය නම් නිශ්ශංකමල්ල රජුගේ ශිලාලිපි මෙම ප්‍රදේශයෙන් ද හමුවීමයි. පරාක්‍රමබාහු කුමාර අවධියේ දී ස්වකීය ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානය වශයෙන් පඬුවස්නුවර තෝරාගනු ලබන්නේ සුවිශේෂී කරුණු ගණනාවක් පදනම් කරගනිමින් විය යුතු ය. ඒවා අතරින් යම් ප්‍රමාණයක් පුරාවිද්‍යාත්මක ශේෂයන් වශයෙන් හඳුනාගත හැකි ය. මහාවංසය ඇතුළු සාහිත්‍යය මූලාශ්‍ර ද ශිලාලිපි ද අවශේෂ පුරාවිද්‍යාත්මක සාධක ඇසුරෙන් ද පාලන මධ්‍යස්ථානයක් බවට පත්වීමට පූර්වයේ පටන් පඬුවස්නුවර ආර්ථික වශයෙන් ද, දේශපාලනික වශයෙන් ද, ආගමික වශයෙන් ද සුවිශේෂී භූමියක් වූ බව පැහැදිලි වේ. මේ ආශ්‍රිත ව ක්‍රි. පූ. අවධියේ පටන් විවිධ පාලකයන් යටතේ සංවර්ධනය වූ වාරිකර්මාන්තයක් ද ක්‍රි. ව. 8 - 9 කාලයට අයත් රජරට පාලකයාගේ ඍජු අවධානයට පාත්‍ර වූ ආගමික මධ්‍යස්ථාන කිහිපයක් ද ක්‍රි. ව. 11වැනි සියවසේ චෝළයන් විසින් නිර්මාණය කරගත් යුද බලකොටුවක සාධක ද හමු වේ. මේ අනුව ආරක්ෂාව, ආර්ථික සුරක්ෂිතතාවය මෙන් ම ආගමික පාර්ශවයන්ගෙන් ලැබෙන සහයෝගය වෙනුවෙන් පඬුවස්නුවර පාලන මධ්‍යස්ථානයක් ලෙස තෝරා ගැනීමට පාලකයාව මෙහෙය වූවාට සැක නැත. තව ද අනාගතයේ දී සමස්ත ශ්‍රී ලංකාවේ පාලකයා බවට පත්වීම සඳහා පරාක්‍රමබාහු රජුට සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමට ද පඬුවස්නුවරට හැකි වී ඇත. එබැවින් මෙය රාජ්‍ය පාලකයෙකුගේ පාලන අවශ්‍යතා සපුරාලන ඉතා වැදගත් මධ්‍යස්ථානයක් බවට පත්වෙයි. එනයින් පඬුවස්නුවර පාලන මධ්‍යස්ථනයක් බවට පත්වීම හුදු අහඹු සිදුවීමක් නොව පුළුල් විචක්ෂණශීලි බවකින් හා පරිණත සංවේදීතාවයකින් පළමුවැනි පරාක්‍රමබාහු කුමාර අවධියේ දී සිදු කරන ලද්දක් බව හඳුනාගත හැකි ය.

ප්‍රමුඛ පදඃ පඬුවස්නුවර, 1වැනි පරාක්‍රමබාහු, චෝළ

---

[9]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, nadeeraharsha091@gmail.com.